**ව්‍යාපාර අධ්‍යයනය - 6 - සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර**

1.සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල දැකිය හැකි පොදු ලක්ෂණයක් නොවන්නේ,

1.ආයෝජනයට ලැබෙන ප්‍රතිලාභය අඩු මට්ටමක පැවතීම.
2.ශ්‍රම සූක්ෂම වීම.
3.දක්ෂ කළමනාකරණයක් දැකිය හැකි වීම.
4.ආයෝජිත ප්‍රාග්ධනය කුඩා වීම.
5.වෙළෙඳපොල බොහෝවිට දේශීය වීම.

2.කුඩා ව්‍යාපාරයක් හා ස්වයං රැකියාවක් අතර පවතින වෙනස්කමක් ලෙස සැලකිය නොහැක්කේ,

1.ස්වයං රැකියාවල වැටුප් ලබන සේවකයින් නොමැති අතර කුඩා ව්‍යාපාරවල වැටුප් ලබන සේවකයින් සිටිය හැකිය.
2.ස්වයං රැකියා පුළුල් වීම මගින් කුඩා ව්‍යාපාර බිහි වේ.
3.ස්වයං රැකියා බොහෝ විට ගෘහ කර්මාන්ත ගණයට වැටේ.
4.ස්වයං රැකියාවලට වඩා කුඩා ව්‍යාපාරවලට ක්ෂණිකව තීරණ ගැනීමේ හැකියාව ඉහළයි.
5.ස්වයං රැකියාව තුළින් උපයන ලාභයට වඩා ඉහළ ලාභයක් කුඩා ව්‍යාපාර තුළින් ඉපයිය හැකිය.

3.සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර මැන ගත හැකි ප්‍රමාණාත්මක නිර්ණායක පමණක් අඩංගු පිළිතුර වන්නේ,

1.සේවක සංඛ්‍යාව/ආයෝජිත ප්‍රාග්ධනය/නිමවුමේ ස්වරූපය/නිෂ්පාදන ධාරිතාවය
2.සේවක සංඛ්‍යාව/නිෂ්පාදන ධාරිතාවය/වාර්ෂික පිරිවැටුම/ස්ථාවර වත්කම්
3.සේවක සංඛ්‍යාව/වෙළෙඳපල ස්වභාවය/නිමවුමේ ස්වරූපය/නිෂ්පාදන ධාරිතාවය
4.සේවක සංඛ්‍යාව/භාවිතා කරන තාක්ෂණය/විදුලි බල ධාරිතාවය/ස්ථාවර වත්කම්
5.සේවක සංඛ්‍යාව/විදුලි බල ධාරිතාවය/සේවකයින් සමීප ලෙස සුපරීක්ෂණය කිරීමේ හැකියාව

4.කුඩා පරිමාණ ව්‍යාපාරයක් සාර්ථක වීමට අවශ්‍ය මූලික කොන්දේසි පහතින් දැක්වේ.ඒවා අතර අත්‍යවශ්‍ය නොවන කොන්දේසිය තෝරන්න.

1.තමා පිළිබඳව හා තම ව්‍යාපාරය පිළිබඳ තේරුම් ගැනීම.
2.මනා කළමනාකාරීත්වයක් පවත්වා ගැනීමට ඇති හැකියාව

3.ව්‍යාපාරය පිහිටා ඇති ප්‍රදේශයේ දේශපාලනඥයින්ගේ දැන හැඳුනුම්කම

4.විවිධ රාජ්‍ය හා පෞද්ගලික ආයතනවලින් ලබා ගත හැකි සහාය

5.ව්‍යාපාර පරිසරය සහ ප්‍රජාව පිළිබඳ මනා අවබෝධය

5.සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර දිරිගැන්වීම සඳහා රජය විසින් විවිධ දිරිගැන්වීම් සිදු කරනු ලබයි.ඒ අනුව මූල්‍යමය වශයෙන් ලබා දෙන දිරිගැන්වීම් පමණක් ඇතුළත් පිළිතුර වන්නේ,

1.බදු සහන/උපදේශන සේවා/මූල්‍යමය ආධාර/ප්‍රතිමූල්‍ය පහසුකම්

2.කෙටිකාලීන හා දිගුකාලීන ණය/මූල්‍යමය ආධාර/බදු සහන/යටිතල පහසුකම් සැපයීම

3.ප්‍රතිමූල්‍ය පහසුකම් සැපයීම/බදු සහන/අලෙවි පහසුකම් ව්‍යවසායක සංවර්ධන වැඩසටහන්/මූල්‍යමය ආධාර

4.බදු සහන/ප්‍රතිමූල්‍ය පහසුකම්/මූල්‍යමය ආධාර/කෙටිකාලීන හා දිගුකාලීන ණය

5.මූල්‍යමය ආධාර/යටිතල පහසුකම් සැපයීම/ප්‍රතිමූල්‍ය පහසුකම්/ව්‍යවසායකත්ව සංවර්ධනය

## පිළිතුරු

1. 3
2. 4
3. 2
4. 3
5. 4

**සකස් කළේ -**

**ර/රත්නපුර ධර්මපාල විද්‍යාලය.**